// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2084/19 - 2018 අගෝස්තු මස 15 වැනි බදාදා - 2018.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්
## මහරගම නගර සභාව

**(262 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**

66 අ(1) (1අ) වගන්තිය යටතේ දැන්වීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මහරගම නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ අංක 18 මහරගම දකුණ කොට්ඨාසයට පත්කරන ලද නුවන් මධුශංඛ ප්‍රනාන්දු අයත් වන්නා වූ අංක 02 දරන ස්වාධීන කණ්ඩායමේ නායකයාට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති 8 වගන්තිය යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම මහරගම නගර සභාවේ අංක 18 මහරගම දකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් අංක 02හි කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අංගොඩ ලියනගේ ප්‍රදීප් චමින්ද නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

මහරගම නගර සභාවේ තේරීම්භාර නිලධාරි සුදු දේවගේ ශානික අනුරුද්ධ රූපසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 66 අ (1) (1අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අංගොඩ ලියනගේ ප්‍රදීප් චමින්ද මහරගම නගර සභාවේ අංක 18 මහරගම දකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්.ඩී.එස්.ඒ. රූපසිංහ,
තේරීම්භාර නිලධාරි,
මහරගම නගර සභාව.

2018 අගෝස්තු මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ,

08-1031

1A - G 28276 - 17 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.